

**පුරෝගාමී ශ්‍රී ලාංකික සමාජවාදියා ඇගේ සියවැනි උපන්දිනය සමරයි.**

කැරොලයින් ඇන්තනි පිල්ලෙයි, 1940 දී පමණ

# කැරොලයින් ඇන්තනි පිල්ලෙයි

## බොරළුගොඩ සිංහ ධේනුව

ශ්‍රී ලංකාවේ මුල් කාලීන සමසමාජ ව්‍යාපාරයේ අවසන් ජීවමාන පුරුක වන කැරොලයින් ඇන්තනි පිල්ලෙයි ඔක්තෝබර් 8 වැනි දින සියවැනි වියට පා තබනු ඇත. කැරොලයින්ට හා ඇගේ පවුලට ප්‍රීති උත්සව පැවැත්වීමට බොහෝ හේතු ඇත. ඇය බොහෝ ආකාරයන්ගෙන් පුරෝගාමිනියක වූවාය. ඇගේ ආවේගශීලී වැඩිමහළු සොහොයුරන් වන පිලිප් හා රොබට් ගුණවර්ධන විසින් දේශපාලනයට ඇදගනු ලැබූ ඇ තිස් ගණන් වල මුල් අවධියේදී වැඩී එමින් තිබූ ලංකා ජාතික ව්‍යාපාරයට සහභාගි වූ අතර, 1935 දී ලංකා සම සමාජ පක්ෂය (ලසසප) ආරම්භ කිරීමට උපකාර වූවාය.

දෙවන ලෝක යුද්ධ සමයේදී, කැරොලයින් ඇගේ සැමියා වූ ජේ. සී. සී. ඇන්තනී පිල්ලෙයි ද සමඟ ඉන්දියාවේ සැඟවී ක්‍රියාත්මක වූ ට්‍රොට්ස්කියානු පක්ෂය වෙනුවෙන් වැඩ කළාය. 1947 දී ඇය ඉන්දියානු කම්කරු සටනේ සන්ධිස්ථානයක් බවට පත් වූ මදුරාසියේ දින 100 යේ රෙදි වැඩ වර්ජනයට නායකත්වය දුන්නාය. නිදහසින් පසුව, සමාජවාදී ව්‍යාපාරයේ වාමාංශික අංශය ගොඩනැගීමට සහාය වීම පිණිස ඇය හා ඇගේ සැමියා ඉන්දියාවේ රැඳී සිටියහ. ඇගේ සහායෙන් ඔහු ජාතික මට්ටමේ වෘත්තීය සමිති හා පාර්ලිමේන්තු නායකයෙකු බවට පත් වූයේය. 2000 දී ඔහු මිය ගිය විට, කැරොලයින් අවසානයේ ඇගේ උපන් බිමට ආපසු පැමිණියාය. වෙනත් යුගයකදී ඇ උපත ලද බොල්ගොඩ පාරම්පරික නිවස අසල නිවෙසක ඇ සිය පවුලේ අය සමග දිවි ගෙවන්නීය.

**හැදී වැඩුනු කාලය :**

දෝන කැරොලයින් රූපසිංහ ගුණවර්ධන 1908 ඔක්තෝබර් 08 වැනි දින අවිස්සාවේල්ල දිස්ත්‍රික්කයේ ග්‍රාමීය බොරළුගොඩ පෙදෙසේ උපන්නාය. ඇගේ පියා වූ දොන් ජාකෝලිස් රූපසිංහ ගුණවර්ධන ගමේ රාළහාමි (ගම් ප්‍රධානියා) හා විදානෙ ආරච්චි (ප්‍රාදේශීය පොලිස් නිලධාරී) ලෙස බ්‍රිතාන්‍ය යටත් විජය ආණ්ඩුවට සේවය කළ ඉසුරුමත් ඉඩම් හිමියෙකු විය. එම පළාතේ වැසියන් ඔහුව ගරුසරු ලෙස හැඳින්වූයේ බොරළුගොඩ රාළහාමි නමිනි.

ඔහු තම දරුවන් සියළු දෙනාටම ඉංග්‍රීසි නම් තැබුවේ හැරි, පිලිප්, බෙන්ජන් (රොබට්), සේරා, ඇග්නස්, සොපියා, එමිලි ඇන්ජලින් ඇලිස් හා කැරොලයින් ලෙසිනි. එසේ වුවත්, තම සිංහල බෞද්ධ සංස්කෘතිය පිළිබඳව ආඩම්බර වීමට ඔහු ඔවුනට ඉගැන්වූයේය. බොරළුගොඩ විහාරයේදී හා බොරළුගොඩ ආසන්නයේ පිහිටි කලුඅග්ගල සිද්ධාර්ථ විද්‍යාලයෙන් ඔහු තම දරුවන්ට පාසල් අධ්‍යාපනය ලබා දුන්නේය.

1915 දී සිංහල බෞද්ධයන් හා මුස්ලිම් වෙළඳුන් අතර වාණිජමය කටයුතු නිසා ඇති ව තිබූ සතුරුකම වාර්ගික ප්‍රචණ්ඩත්වය දක්වා වර්ධනය විය. බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරයා මාර්ෂල් නීතිය පැනවූ අතර කැරොලයින්ගේ පියා ද ඇතුළුව සැකයට ලක් වූ ජාතික වාදී ව්‍යාපාරයේ අයවළුන් අත්අඩංගුවට ගන්නා ලදී. කැරොලයින්ගේ පියාට විරුද්ධව වූ චෝදනාව, ප්‍රචණ්ඩ ලෙස හැසුරුණු අයට ඩයිනමයිට් ලබා දීම වූ අතර ඔහුට මරණ දඬුවම නියම කරනු ලැබ මාස හතක් සිරගත කර සිටීමෙන් අනතුරුව සාක්ෂි නැතිකමින් ඔහුව නිදහස් කරන ලදි. මෙම වේදනාකාරි අත්දැකීම ගුණවර්ධන පවුලේ සාමාජිකයන් අචල ජාතිකවාදින් බවට පත් කළේය. තම දරුවන් වේල්ස් කුමාර විදුහලෙන් අස් කරත් බොරළුගොඩ රාළහාමි ඔවුන්ව පිරිමි ළමුන් සඳහා වූ පරම විඥනාර්ථ බෞද්ධ පාසල වූ ආනන්ද විද්‍යාලයට ඇතුළත් කළේය. කැරොලයින් හා ඇගේ සොහොයුරියන් ආනන්දයෙහි සහෝදර පාසල වූ මියුසියස් විද්‍යාලයට යවන ලදී. මියුසියස් විද්‍යාලයේ අධ්‍යාපනය අවසන් කිරිමෙන් පසු කැරොලයින් ආපසු ගමට පැමිණ සිද්ධාර්ථ විද්‍යාලයේ ඉගැන්වීම ආරම්භ කළාය.

කැරොලයින් කිසි විටෙකත් බලය ඉදිරියේ හිස නැමූ තැනැත්තියක නොවූවාය. ඇගේ ලේලිය, විවියන් ගුණවර්ධන (ගුණතිලක) කරෝ නැන්දා තමන්ට නිර්භීත හා මුරණ්ඩු වීමට ඉගැන්වූ අයුරු සිහිපත් කළේ මෙසේය. ‘මේ තරුණ රැකවලිය නාවන්නට ගෙනත් හිටි අලින්ගේ බඩ යටින් රිංගන්න පුංචි ළමයින්ව පෙළඹෙව්වා. ඒකත් කීප සැරයක්ම ඇ ළමයින් ලවා කෙරෙව්වා. මේ මැර වැඩේ දැනගත්ත හැම වතාවකම පොඩි ළමයින්ට ධෛර්ය සම්පන්න වෙන්න උගන්වන්න උත්සාහ කිරීම වෙනුවෙන් කැරොලයින්ට ඇගේ අම්මාගෙන් වේවැල් පාර ලැබුණා. වේවැල් පාර කොහොම උණත් පාඩම් ආයෙත් ඉගැන්වුණා.’ (පුල්සරා ලියනගේ, විවී, විවියන් ගුණවර්ධනගේ ජීවිත කථාව, 1998)

**විප්ලවීය පක්ෂයට පූර්විකාව**

විසි ගණන් වල පසුභාගයේදී, කැරොලයින් හා ඇගේ සොහොයුරෝ පූර්ණ නිදහස ඉලක්ක කරගත් ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රතිසංස්කරණ ඉල්ලා සිටි ජාතිකවාදී තරුණ කණ්ඩායමෙහි ක්‍රියාකාරී සාමාජිකයන් වූහ. 1931 දී රාජ්‍ය මන්ත්‍රණ සභාවක් රැස් කෙරෙනු ඇති බවට බ්‍රිතාන්‍යයන් නිවේදනය කළ විට, හැරී ගුණවර්ධන අවිස්සාවේල්ල මැතිවරණ කොට්ඨාශයට තරඟ වැදීමට තීරණය කළේය. කැරොලයින් තම සොහොයුරා වෙනුවෙන් ප්‍රචාරක කටයුතු කළාය. ධනවත් බලවත් අයෙකු වූ තම ප්‍රතිවාදියා මෙම හිටිඅඩියේ ඉහළ නැගි අයගේ අභියෝගයෙන් කුපිතව සිටි අයුරු රොබට් සිය මතක සටහන් වල විස්තර කරයි. (ඩේලි මිරර්, 1971 නොවැම්බර් 9) හැරී පරාජයට පත් වුවත්, කැරොලයින් තමන්ට හිමි මහ සොයාගත්තාය. එතැන් පටන්, ලංකාවට හා ඉන්දියාවට නිදහස ලබා ගැනීමට හා සැමට සමාජ සාධාරණය දිනාගැනීමට ඇ තම ජීවිතය කැප කළාය.

1932 අග භාගයේදී ඇ.එ.ජ. හා එංගලන්තයේ වසර 10 ක් තාවකාලිකව රැඳී සිටීමෙන් අනතුරුව ඇගේ සොහොයුරු පිලිප් ලංකාවට පැමිණියේය. එහිදී ඔහු ස්ටාලින්ට එරෙහිව ට්‍රොට්ස්කිට සහාය දීම නිසා ඔහුව නෙරපන තුරුම, මහා බ්‍රිතාන්‍ය කොමියුනිස්ට් පක්ෂයේ ක්‍රියාකාරී සාමාජිකයෙකුව සිටියේය. නිවසට යළි පැමිණීමෙන් පසු, ඔහු කැරොලයින් හා රොබට්ව තම විප්ලවීය දර්ශනයට හරවා ගත්තේය. ලංකාවේ විප්ලවීය සංවිධානවල න්‍යෂ්ඨිය මෙය විය.

සැමරුම් දිනය නිල මට්ටමින් පැවැත්වීමට විරෝධය පෑ ආකාරයක් වූ වාර්ෂික සූරිය මල් ව්‍යාපාරයට කැරොලයින් සහභාගි වූවාය. පළමුවැනි ලෝක යුද්ධයේදී බ්‍රිතාන්‍යයන්ට සිය අධිරාජ්‍යය ආරක්ෂා කරගැනීමට උපකාර වීම සඳහා ලාංකික සොල්දාදුවන් සටන් කර ඇත. එසේ වූවත්, බ්‍රිතාන්‍ය ප්‍රවීණයන් ලැබූ ප්‍රතිලාභ ඔවුනට භුක්ති විඳීමට නොලැබිණි. කැරොලයින් හා ඇගේ පක්ෂයේ සහෝදරවරු සූරියමල් ක්‍රියාකාරිත්ව උනන්දු කළේ අධිරාජ්‍ය විරෝධී සටන්පාඨ වලිනි.

1993 - 34 දී මැලේරියා වසංගතයක් පැතිර ගිය විට, ආහාර හා ඖෂධ ලබා දීම සඳහා සූරියමල් ක්‍රියාකාරීහු ඉන් බලපෑමට ලක් වූ ගම්මාන කරා විසිර ගියහ. කැරොලයින් මෙහිදී වැදගත් කාර්යභාරයක් ඉටු කළාය. ගුණවර්ධන පවුලේ උදව්ය බොරලුගොඩ සිය නිවසේ බෙහෙත් ශාලාවක් පිහිටවූහ. ගුණවර්ධනවරුන් වටා වූ කණ්ඩායමට එක් වූ මියුසියස් විදුහලේ තමන් හා එක පංතියේ උගත් සෙලිනා පෙරේරා (පීරිස්) සමඟ කැරොලයින් සම්පව කටයුතු කළාය.

## ල.ස.ස.ප.

1935 දී, දෙවැනි රාජ්‍ය මන්ත්‍රණ සභා මැතිවරණ 1936 මුල්භාගයේදී පැවැත්වෙනු ඇති බව බ්‍රිතාන්‍ය ආණ්ඩුව නිවේදනය කළේය. සමාජවාදී පක්ෂයක් ආරම්භ කර රාජ්‍ය මන්ත්‍රණ සභාවට අධීක්ෂකයන් ඉදිරිපත් කිරීමට කාලය පැමිණ ඇති බවට සූරිය මල් ක්‍රියාකාරීහු තීරණය කළහ. නව පක්ෂය පිටුපසින් වූ ගාමක බලවේගය වූයේ පිලිප් ගුණවර්ධනයි. සියළු වාර්ගික, කුල, පංති හා ස්ත්‍රී පුරුෂසමාජභාවයට අදාළ අසාධාරණයෙන් විනිර්මුක්ත වූ සමානාත්මතාවෙන් යුත් සමාජයක් (සම සමාජ) නිර්භීතව අරමුණු කරගත් රතු පක්ෂයකට එක්වී සම්ප්‍රදාය පිටුදැකීමට තරම් ධෛර්යයක් කැරොලයින් සතු විය. අනෙකුත් කැපී පෙනෙන නායිකාවන් වූයේ පසුව පක්ෂ නායක ඇන්. ඇම්. පෙරේරා හා විවාපත් වූ ඇගේ මිතුරිය සෙලිනා පීරිස් හා දැඩි ස්ත්‍රීවාදිනියක වූ සුසාන් ද සිල්වා ය.

නව පක්ෂය රාජ්‍ය මන්ත්‍රණ සභාවට තරඟ කිරීමට අපේක්ෂකයින් සිව් දෙනෙකු වහාම නම් කළේය. පිලිප් අවිස්සාවේල්ල ආසනය තරඟ කළේය. පිලිප් වෙනුවෙන් ඡන්ද ප්‍රචාරක කටයුතුවල යෙදෙමින් කැරොලයින් ගමක් පාසා පිය මැන්නාය. කවර වේදිකාවක වුවද දක්ෂ කථිකයෙකු වූ ඔහු ඉක්මනින්ම 'බොරළුගොඩ සිංහයා' නමින් පතළ විය. ඔහු විශාල වැඩි ඡන්ද ගණනකින් ජය ලැබුවේය. ඇන්. ඇම්. පෙරේරා ද රුවන්වැල්ල ඡන්ද කොට්ඨාශය ජයග්‍රහණය කළේය. මෙම ජනප්‍රිය ලසසප නායකයෝ දෙදෙනා මාක්ස්වාදයේ පණිවිඩය ජනතාව වෙත විසුරුවා හැරීමටත් ඔවුන් වෙනුවෙන් ප්‍රතිසංස්කරණ සඳහා සටන් කිරීමටත් මන්ත්‍රණ සභාව බෙදා ගත්හ.

කැරොලයින් තමන්ටම ආවේනික අනන්‍යතාවයකින් හෙබි ගෞරවයට පාත්‍ර වූ පක්ෂ නායිකාවක බවට පත් වූවාය. 1937 ඉන්දියානු ජාතික කොංග්‍රසයේ ෆායිස්පූර් සැසිවාරයට ලසසපයෙන් යැවෙන දූත පිරිසට පක්ෂය කැරොලයින්වද තෝරා ගත්තේය. කැරොලයින් පක්ෂයේ කාන්තාවන්ට, විශේෂයෙන් ම පසුව පිළිවෙලින් ලෙස්ලි ගුණවර්ධන හා පිලිප් ගුණවර්ධන හා විවාහ වූ විවියන් ගුණතිලක හා කුසුමසිරි අමරසිංහට ආදර්ශ චරිතය වූවාය.

## ආදරය, විවාහය හා වැඩ වර්ජන

1937 - 38 කාලයේදී 'ටෝනි' යන සුරතල් නමින් හඳුන්වනු ලැබූ එස්. සී. සී. අන්තෝනි පිල්ලෙයි ඇතුළු දක්ෂ ද්‍රවිඩ තරුණයන් ගණනාවක් ලසසප ට සම්බන්ධ විය. පක්ෂ නායකයන්ට හැඟී ගියේ ටෝනිට වෘත්තීය සමිති නායකයෙකු වීමට ශක්‍යතාව ඇති බවයි. කෙසේ වෙතත්, ඔහුට සිංහල කථා කිරීමට නොහැකි වූ අතර, එය විශාල බාධකයක් විය. එහෙයින් සිද්ධාර්ථ විද්‍යාලයේදී තම සොහොයුරිය කැරොලයින්ගෙන් සිංහල ඉගෙන ගන්නා ලෙස පිලිප් ගුණවර්ධන ටෝනිට යෝජනා කළේය. බොහෝ ආකාරවලින් කැරොලයින් හා ටෝනි ඉතා දුරස් තැනැත්තෝ වූහ. ඔහු සන්සුන් හා උපක්‍රමශීලී වූ අතර ඇ ආවේගාත්මක වූවාය. ඔහු ද්‍රවිඩයෙකි. ඇ සිංහලය. ඔහුගේ මව්පියන් ක්‍රිස්තියානින් වූ අතර, ඇගේ මවුපියෝ බෞද්ධයන් වූහ. ඔහු 24 වැනි වියේ පසුවිය. ඇයට වයස 30 ක් විය. එහෙත් දෙදෙනා බොහෝ සමීපව, පෙමින් බැඳුනහ. 1939 දී වාම් උත්සවයකදී කැරොලයින් හා ටෝනි විවාහ වූහ.

ලසසප අලුත විවාහපත් යුවල, නුවරට සැතපුම් 25 ක් පමණ දකුණින් පිහිටි තේ වගාවෙන් වට වූ කඳුකර නගරයක් වූ නාවලපිටියට යැවූයේ ද්‍රවිඩ වතු කකරුවන් ලසසප වෘත්තීය සමිතියකට සංවිධානය කිරීමටයි. එය අසීරු අවදානම් කාර්යයක් විය. කලබල ඇති කරන්නන්ට පැමිණීමට ඉඩ නොදීමට බ්‍රිතාන්‍ය වැවිලිකරුවෝ තම කංකානිවරුන් හා කඩපිලේ චණ්ඩින් යොදාගත්හ. නාවලපිටියේ ජීවත් වූ කාලයේදී කැරොලයින් තම පළමුවැනි පුත්‍රයා වූ මහේන්ද්‍රන් හා ඊළඟට රංජිත් සෙන් බිහි කළාය. කථා පවත්වන අතර, රැස්වීම් සංවිධානය කරන අතර ඇගේ පවුලේ අවශ්‍යතාවයන්ට කැපවීමටද ඇට සිදු විය.

එවකට යුරෝපයේ දෙවැනි ලෝක යුද්ධය, ආරම්භ වූ අළුතම ය. ට්‍රොට්ස්කි පිළ අනුගමනය කරමින් ලසසප දැඩි ලෙස 'අධිරාජ්‍යවාදී යුද්ධයට' එරෙහි විය. තවදුරටත් ට්‍රොට්ස්කිවාදී කලබල ඇතිකරන්නන් ඉවසා සිටීමට අකමැති වූ යටත්විජිත ආණ්ඩුව රාජ්‍ය මන්ත්‍රණ සභා නියෝජිතයන් දෙදෙනාද ඇතුළුව ලසසප නායකයන් සිව් දෙනෙකු අත් අඩංගුවට ගත් අතර, පක්ෂ මුද්‍රණාලය තහනම් කර පක්ෂ ක්‍රියාකාරකම් ද තහනම් කළේය. මර්දනයේ ග්‍රහණය දැඩි වෙද්දිත්, ටෝනි හා කැරොලයින් තම කටයුතු ඉදිරියට ගෙන ගියහ. 1940 - 41 දී ඔවුහු බස් කම්කරුවන්, වරාය කම්කරුවන් හා ධාන්‍යාගාර කම්කරුවන් සහභාගි වූ වැඩවර්ජනවලට නායකත්වය දුන්හ. ඇගේ බෑණනුවන් වන අජිත් ගුණවර්ධන මෑතකදී මා හට පැවසුවේ කැරොලයින් ඉතා දැඩි වූ බවයි, පිලිප්ටත් රොබට්ටත් වඩා දැඩි වූ බවයි.

## ඉන්දියාවට නික්ම යාම

1942 අප්‍රේල් මස, ලසසප රහස් ක්‍රියාකාරීහු තම නායකයන් සිරෙන් නිදහස් කරගැනීමට ඉතා සියුම් ලෙස සැලසුම් කර ගලවා ගැනීමේ මෙහෙයුමක් දියත් කළහ. සිරගෙය බිඳගෙන යාම මර්දනය තවත් ඇති කළේය. ඒ අතරවාරයේ, ඉන්දියාවේ ගාන්ධිතුමා බ්‍රිතාන්‍යයන්ට ඉන්දියාව හැර යාමට බල කිරීම සඳහා මහා ජන ගංගා කැඳවන බවට තර්ජනය කරමින් සිටියේය.
ට්‍රොට්ස්කිවාදී සංවිධානයක සැකිල්ලක් වූ ඉන්දියානු බොල්ෂෙවික් ලෙනින්වාදී පක්ෂය (BLPI) සංවිධානය කිරීමට ලසසප ඒ වන විටත් උදව් කර තිබිණ. ශ්‍රී ලංකාවේ වැඩි යමක් කිරීමට නොහැකි තත්ත්වයක් ඇති වූ බැවින් ඉන්දියාවට පලා ගොස් ඔවුන්ගේ BLPI සහෝදරයන්ට ඉදිරියේ ඇති වීමට තිබූ මහා අරගලවලට සහාය වීමට ලසසප නායකයෝ තීරණය කළහ.

1942 ජූලි මාසයේදී ලාංකික ට්‍රොට්ස්කිවාදීන් දුසිම් දෙකක් පමණ ධීවර යාත්‍රා මගින් රහසිගතව ඉන්දියාවට පළා ගියහ. වැඩි දෙනෙක් බොම්බාය බලා ගිය අතර ටෝනි මදුරෙයි වෙත ගියේය. කනස්සල්ලට පත් කැරොලයින් දරු දෙදෙනාද සමඟ මෙහි රැඳී සිටියාය. මසකට පසු 'ඉන්දියාව හැර යනු' කැරැල්ල ඇරඹිනි. ක්ෂේත්‍රයට නවක වූ BLPI එය සතු සීමිත සම්පත් සටනට යෙදෙව්වේය. මදුරෙයිහිදී ටෝනි හා එරට BLPI සාමාජිකයන් ටික දෙනෙකු එක්ව කැරැල්ලට සහාය පිණිස පත්‍රිකා මුද්‍රණය කළහ. 'ඉන්දියාව හැරයනු' කැරැල්ල සමනය වූ විට, මදුරාසියට පැමිණ තමන්ට එක් වෙන මෙන් ටෝනි කැරොලයින්ට පණිවුඩයක් එව්වේය. අවසානයේදී පවුල නැවත එක් විය. එසේ වුවත්, තත්ත්වය ඉතා දුෂ්කර විය. පොලීසිය සෑම තැනම ට්‍රොට්ස්කිවාදීන් සෙවීමේ යෙදී සිටියේය. ඇය බැහැරට ගියේ දැඩි අවදානමකට මුහුණ දෙමිනි. චතුර ලෙස දෙමළ කථා කළ නොහැකි වූ ඇයට එරට ජනයා හා සම්මිශ්‍ර වීම අපහසු විය. ඇය ජීවත් වූ ආකාරයද අවදානම් සහිත විය. ඈ හා ටෝනි තම තට්ටු නිවාසය තරුණ පක්ෂ සහෝදරවරුන් ගණනාවක් සමග හවුලේ බෙදාගත්හ. නිතර වූ යාම් ඊම්, දවසේ හැම වේලාවකම පාහේ පැවති රැස්වීම් මිනිසුන් ඒ ගැන විමසිල්ලෙන් කතා කරන්නට යොමු කරන්නට ඇත.

## ලංකාවට ආපසු පැමිණීම

1943 ජූලි මාසයේදී පිලිප් හා කුසුමා ගුණවර්ධන හා තවත් කරුණ සහෝදරවරුන් දුසිම් භාගයක් පමණ රැඳී සිටී. බොම්බායේ BLPI රහස් නිවහන පොලීසිය විසින් වටලන ලදී. බොම්බායේ සිටි අනෙකුත් ලාංකික පලායන්නෝ බේරී මදුරාසියට පැනගත්හ. එහිදී ඔවුන් සරණ ලැබුවේ කැරොලයින් හා ටෝනි විසූ තේනාම්පෙට්හි වීනස් කොලනියේ විශාල තට්ටු දෙකේ නිවසකය.
පොලීසිය නිතරම ඔවුන් ලුහුබඳිමින් සිටි බැවින් දරුවන් ආපසු ලංකාවට ගෙනයාම සුදුසු බව කැරොලයින් හා ටෝනි තීරණය කළහ.

කැරොලයින් පිටත්ව ගිය පසුව වඩා සුරක්ෂිත යැයි සිතූ ස්ථානයකට ටෝනි පදිංචිය මාරු කළේය. එය නාම්පල්ලි දුම්රියපොළ ඉදිරිපිට සුප්‍රසිද්ධ අම්බිකැෆේ පිටුපස සරල මඩුවක් විය. නොසිතූ ලෙස එය ඔවුන්ගේ අවාසියට හේතුවිය. අසල්වැසි පරිසරයේ වැඩි වශයෙන් සිටියේ දැඩි නිර්මාංශ ආහාර ගන්නා බ්‍රාහ්මී ජනයාය. එබැවින් ටෝනි සමග විසූ අනෙක් තරුණ සහෝදරවරු තම මාංශ සහිත ආහාර වේල් ලබාගැනීමට නගරයේ වෙනත් පෙදෙසකට ගියහ. කවුරුන් හෝ ඔවුන්ව හඳුනා ගෙන පොලිසියට දැනුම් දුන් අතර පොලිසිය ඔවුන් පසුපස නවාතැනට පැමිණ සියල්ලන්ම අත්අඩංගුවට ගත්තේය. කැරලි ගැසීමට පොළඹවන සුළු ලියවිලි ළඟ තබාගැනීමේ චෝදනාව මත ටෝනි හා තවත් ලාංකික සහෝදරයෙකු අලිපුරම් බන්ධනාගාරයේදී වසර දෙකක බරපතල වැඩ සහිත සිරදඬුවමකට යටත් කරන ලදී.

## ඇගේ දේශපාලන දිවියේ උච්චතම අවස්ථාව

අලිපුරම්වලින් නිදහස් කෙරුණු පසු, ටෝනි ලංකාවට ආපසු පැමිණියේය. නමුත් ඔහුට හා කැරොලයින්ට තම රටේ දේශපාලන ජීවිතයට යළි අනුගත වීමට ලැබුණේ කෙටි කලකි. ඔවුන් බකිංහැම් හා කාර්නටික් මෝල් වල යුද්ධ කාලයේදී කළ කටයුතුවල ප්‍රතිඵල ලැබී ඇති බව මදුරාසියේ BLPI කියා එවීය. රෙදි මෝල් කම්කරුවන් නියෝජනය කරන ඉන්දියාවේ පැරණිම හා විශාලම වෘත්තීය සමිතිය වූ මදුරාසි වෘත්තීය සමිතියේ සභාපතිවරයා නායකත්වය ටෝනිට භාරදීමට කැමැත්තෙන් සිටියේය. එය ප්‍රතික්ෂේප කළ නොහැකි අවස්ථාවක් විය. එබැවින්, ටෝනි, කැරොලයින් හා දරුවෝ ආපසු මදුරාසියට ගියහ.



කැරොලයින් ඇන්තනි පිල්ලෙයි සහ එස්.සී.සී ඇන්තනි පිල්ලයි. මයික්‍රෆෝනයෙන් අමතමින් කොංග්‍රස් නායක කේ. කාමරාජ්. කැරොලයින් සහ ටෝනි අතර සිටගෙන සිටින්නේ බී.එල්.පී.අයි.හි හිටපු සාමාජික සී.කේ. නාරායන් සහ මැඩ්රාස් වෘත්තීය සමිතියේ ලේකම්වරයායි. 1974

1946 ජුනි 6 වෙනි දින ටෝනි මදුරාසි වෘත්තීය සමිතියෙහි සභාපති ලෙස තේරී පත් විය. ඊට පසු දිනම කම්හලේ සිදුවීමක් නිසා වැඩවර්ජනයක් ඇති විය. කැරොලයින් හා ඇගේ BLPI සහෝදරවරු වැඩ වර්ජන සහායක කටයුතු වල මුළුමනින්ම යෙදුණහ. දින 48කට පසු සංගමය සිය ප්‍රධාන ඉල්ලීම් දිනාගත්තයේ. 1947 මුල් භාගයේදී B&C කම්හලේ තත්ත්වය නැවත උණුසුම් විය.

වෘත්තීය සමිති නායකයෝ වර්ජන අරමුදල් රැස් කිරීමට පටන් ගෙන, අසල්වැසි කම්ටු ජාලයක් සංවිධානය කර කම්කරු ආරක්ෂක වැඩ පිළිවෙලක් සඳහා ස්වේච්ඡා ක්‍රියාකාරීන් දහසක් බඳවා ගත්හ. වර්ජනය පටන් ගත් පසු ටෝනිව අත්අඩංගුවට ගැනෙනු ඇතැයි උපකල්පනය කර වෘත්තීය සමිතිය කැරොලයින්ට නායකත්ව කාර්යභාරයක් පැවරෙන ආකාරයට රහස් වැඩ වර්ජන

කමිටුවක් සකස් කළේය. මෙම කමිටුවට බුද්ධිමය දායකත්වය හා ශක්තිය සැපයුවේ ට්‍රොට්ස්කිවාදින්ය.

මාර්තු 10 වන දිනට පහන් වීමට පෙර පොලීසිය ටෝනිව අත්අඩංගුවට ගත්තේය. රහස්‍ය කමිටුව එදින සවස මහා රැස්වීමක් කැඳවීය. එක් ඇසින් දුටු සාක්ෂිකරුවෙකුට අනුව, මෙම රැස්වීමේදී 'ඇගේ ආවේගයන්හි උච්චම තත්ත්වයෙන් කැරොලයින් ඇන්තනි පිල්ලෙයි මහත්මිය කළ කථාව කම්කරුවන්ට තම වගකීම පිළිබඳ නව හැඟීමක් පෙවූ අතර ඇගේ කථාව ඔවුනට නව මාවතක් පෙන්වා දුන්නේය.' ටෝනි හා අනෙකුත් නායකයන් නිදහස් කෙරෙන තෙක් කිසිදු සාකච්ඡාවක් ඇති නොවන බව ඈ කීවාය. පසුදින 14,000කට වැඩි කම්කරුවන්ගෙන් එක් අයෙකුවත් B&C කම්හලට ඇතුළු වූයේ නැත. ටෝනි රඳවා ඇති සිරගෙයට කම්කරුවන් පෙළපාලියෙන් ගමන් කරනු ඇතැයි බිය වූ රජය ඔහුව අන්ද්‍රාහි දුර බැහැර සිරගෙයකට මාරු කර තනිව මැදිරියක රඳවා තැබුවේය.

මාර්තු 28 වැනි දින 40,000 කට වැඩි වර්ජකයන් හා ඔවුන්ගේ පවුල්වල අය වෘත්තීය සමිති රැලියකට රැස් වූහ. එහි ප්‍රධාන කථිකයා වූ කැරොලයින් වැඩවර්ජනයට සහාය පිණිස මදුරාසියේ එක් දින හර්තාලයක් කිරීම අවශ්‍ය බව කීවාය. හර්තාලයකට 100,000 කට වැඩි පිරිසක් සහභාගි වූහ. එම පිරිස සටන්කාමී මනෝභාවයෙන් යුතු විය. කම්කරුවෝ මාර්ග බාධක ඉදි කළහ. විශාල ලෙස බලය පෙන්නුම් කරමින් රජය හමුදා හට කණ්ඩායම් යෙදවීය.

එක් රැයක, කැරොලයින් හා සෙලීනා පෙරේරා පෙරාම්බූර්හි වර්ජන කමිටුවේ රහස් රැස්වීමක් සඳහා පිටත් වූ විට, බස් නැවතුම දක්වා තමන් පසු පස එන මිනිසුන් දෙදෙනෙකු ඔවුන්ගේ අවධානය යොමු විය. නිසැකවම ඔවුන් රහස් පොලිස් නිලධාරීන් බව සිතූ කැරොලයින් සැලසුමක් යෙදුවාය. බසය පැමිණි විට, මිනිසුන් දෙදෙනෙකු නරක අදහසින් තමන් හඹා එන බව කැරොලයින් රියැදුරාට කීවාය. කැරොලයින් බසයේ ඉදිරි දොරටුව අසල සිටගෙන සිටි අතර සෙලීනා පසුපස දොරටුවේ වූවාය. පොලිස් නිලධාරීන් දෙදෙනා බසයට නැගීමට තැත් කරද්දී ඔවුන් හැකි වෙර යොදා එම නිලධාරීන්ට පා පහර දුන් අතර බසය පවනට බඳු වේගයෙන් ධාවනය විය.

පසුදින උදෑසන මලබාර් විශේෂ පොලීසිය කැරොලයින්ගේ නිවස පැමිණ ඈ නිවාස අඩස්සියේ රඳවා තැබුවේය. එයින් කැරොලයින්ගේ ක්‍රියා පිළිවෙත වෙනස් නොවිණි. ඈ ලිපි ලියා ඒවා සිය වැඩිමහල් පුත්‍රයාගේ කලිසමෙහි ඇතුළු පැත්තේ රඳවා පෙරාම්බූර්හි වෘත්තීය සමිති නායකයන් හමුවීමට ඔහුව යැවූවාය. රජය සියළු රැළි හා උද්ඝෝෂණ තහනම් කළ විට, කැරොලයින් හා ඇගේ සහෝදරවරු වෙනත් නිර්මාණශීලී උපාය මාර්ග යොදාගත්හ. එක් අවස්ථාවකදී, වැඩ වර්ජකයෝ 500 ක් පමණ කුඩා කණ්ඩායම් ලෙස මධ්‍යම දුම්රියපොළට රහසින් රිංගූ අතර, පසුව එක් රොක් වී පෙළපාලියෙන් පිටතට ගමන් කළේ සටන් පාඨ කියා කෑගසමින් පොලිසිය පුදුමයට පත් කරවමිනි.

ජූනි 9 වැනි දින රජය වෘත්තීය සමිතිය නීති විරෝධී බවට ප්‍රකාශ කර එහි අරමුදල් තහනම් කර, මූලස්ථානය අගුල් දමා වසා BLPI සාමාජිකයන් 49 ක් අත්අඩංගුවට ගත්තේය. රැයක් පාසා මලබාර් විශේෂ පොලිසියේ 10,000 ක හමුදාවක් කාර්මික දිස්ත්‍රික්ක බිය ගන්වමින් දහස් ගණන් වර්ජකයින් අත් අඩංගුවට ගත්තේය. වර්ජනය අවසන් කිරීම හැර වෙන විකල්පයක් මදුරාසි කම්කරු සංගමයට නොවීය. එසේ වුවත්, තුන් දහසකට ආසන්න කම්කරුවෝ විරෝධතා දක්වමින් කම්හලට නොපැමිණ සිටියහ.

වර්ජනය පරාජය කෙරුණත්, කැරොලයින් හා ටෝනි මදුරාසියේ වැඩ කරන ජනතාවගේ අගය කිරීම හා සහාය දිනාගෙන තිබිණි. 1947 දී ටෝනි, මදුරාසි වරාය භාරය සේවක සංගමයෙහි සභාපති ලෙස තේරී පත් වූ අතර ඊළඟ වසරේදී ඔහු හා මදුරාසි කම්කරු සංගමයේ තවත් ට්‍රොට්ස්කිවාදී නිලධාරීන් දෙදෙනෙක් මදුරාසි මහ නගර සභාවට තේරී පත්වූහ.

## 'මිනිසා පිටුපස සිටි ගැහැණිය'

1948 දී කැරොලයින් ඇගේ තෙවන පුත්‍රයා වන නලින් රන්ජන් බිහි කළ අතර දෙවසරකට පසු ඇගේ සතර වැන්නා සුරේෂ් කුමාර් උපන්නේය. විශාල පවුලක මව ලෙස, ඇයට දේශපාලන සඳහා යෙදවිය හැකි කාලය එන්න එන්නම අඩු විය. මේ අතර ටෝනිව පුළුල් වෙමින් පැවති වෘත්තීය සමිති වගකීම් වලින් වඩ වඩාත් වෙලා ගනු ලැබිණ.

ඔහු බලවත් සමස්ත ඉන්දීය වරාය හා තටාකාංගන සේවක සම්මේලනයෙහි මහ ලේකම් හා උප සභාපති ලෙසද සමස්ත ඉන්දීය ප්‍රවාහන සේවක සංගමයෙහි සභාපති බවටද පත් විය.

1952 දී ඔහු හින්ද් මස්දූර් සභා නම් සමස්ත ඉන්දීය සමාජවාදී වෘත්තීය සමිති සම්මේලනයේ උප සභාපති ලෙස තේරී පත් විය.

ඔහුගේ කටයුතු නිසා ඈට අවසානයේ 'පසු ආසනයක්' ගැනීමට සිදු වුවත් කැරොලයින් තවදුරටත් ඔහුගේ දේශපාලන සහායිකාව ලෙස සිටියාය. ඇය ඔහුට අවවාද දුන්නාය. අසීරු වසර වලදී ඔහුට මූල්‍යමය සහාය ලබා දුන්නාය. ඔහුගේ වෘත්තීය සමිති වැඩට සහාය වූවාය. ඇතැම් විට වඩ වඩාත් සටන්කාමී වීමට ඔහුව පෙළඹවූවාය. ඇය තුළ වූ 'බොරළුගොඩ ගිනි පුපුරු' කිසි විටෙක නිවී ගියේ නැත.

කැරොලයින් ඇන්තනී පිල්ලෙයි දේශපාලනයෙහි ගෙවී ගිය යුගයකට ජීවමාන පුරුකකි. ඈ ඇගේ රටේ නිදහස වෙනුවෙන් සටන් කිරීම හා කම්කරු පංතිය නගා සිටුවීම සඳහා සැප පහසු අනාගතයක් පිටු දැක්කාය. ඈ ඇගේ ජීවිතය කැප කළේ විප්ලවීය පෙර ගමන් කණ්ඩායම වෙනුවෙනි. අවදානම හා දුෂ්කරතා ඉදිරියේ ඈ කිසිවිටෙක පසුබට නොවූවාය. ඈ අන්‍යයන් උනන්දු කරවන බලවේගයක් මෙන්ම ඔවුන්ට මග පෙන්වන ගුරු හරුකම් දෙන්නෙකු ද වූවාය. ඈ බොරුව හා දෙබිඩි පිළිවෙත් දැඩි සේ පිළිකුල් කළාය.

බොරළුගොඩ සිංහ ධේනුව බවට පත් වූ අලින්ගේ බඩ යටින් දිව ගිය නිර්භීත ළඳැරිය - කැරොලයින් ඇන්තනි පිල්ලෙයිට අපි උපහාර පුදමු.

**චාර්ල්ස් වෙස්ලි අර්වින් විසිනි.**

චාල්ස් වෙස්ලි අර්වින්, Tomorrow is Ours, The Trotskyist Movement in India and Ceylon, 1935 - 48 නම් සමාජ විද්‍යාඥයින්ගේ සංගමයෙන් ප්‍රකාශිත ග්‍රන්ථයෙහි කතුවරයා වේ. Email : wes ervin @ bellsouth.net



Printed by The Women and Media Collective and Social Scientists' Association, September 2008.